// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1868/8 - 2014 ජුනි මස 23 වැනි සඳුදා - 2014.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කල්මුණේ මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද කල්මුණේ මහ නගර සභා ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 "ඊ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2014 මැයි මස 19 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

නිමල් පෙරේරා,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2014 ජුනි මස 03 වැනි දින.

### කල්මුණේ නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, නාගරික සංවර්ධන අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය විසින් 2013.10.09 දින සිදු කරන ලද නිර්දේශ සැලකිල්ලට ගෙන 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කල්මුණේ මහ නගර බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
2014 මැයි මස 19 වැනි දින.

07 - 207/1

1A - PG 2085 — 100 (2014/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මඩකලපුව මහ නගර සහා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මඩකලපුව මහ නගර සහා ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 "ඊ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2014 මැයි මස 19 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

නිමල් පෙරේරා,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2014 ජුනි මස 03 වැනි දින.

මඩකලපුව නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, නාගරික සංවර්ධන අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය විසින් 2013.10.09 දින සිදු කරන ලද නිර්දේශ සැලකිල්ලට ගෙන 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මඩකලපුව මහ නගර බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
2014 මැයි මස 19 වැනි දින.

07 - 207/2

---

**බලංගොඩ නගර සහා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද බලංගොඩ නගර සහා ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 "ඊ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2014 මැයි මස 19 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

නිමල් පෙරේරා,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2014 ජුනි මස 03 වැනි දින,

බලංගෙඩ නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2013.10.09 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන බලංගොඩ නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03,
2014 මැයි මස 19 වැනි දින.

07 - 207/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.